**අලව්ව ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අලව්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්‍ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ බැකෝ ලෝඩරය අළුත්වැඩියාව වෙනුවෙන් වයඹ පළාත්පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.298,292 ක වටිනාකම ණය ගැතියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | මහරච්චිමුල්ල උප කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති වටිනාකම රු.243,105 ක් වූ හියුම් පයිප්පවල වටිනාකම අවසන් තොගයට ඇතුළත් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළ ලැබිය යුතු උසාවි දඩ රු.273,500 ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන යන්ත්‍ර උපකරණ, ලී බඩු හා සවිකිරීම් ගිණුමේ එකතුව රු.13,956,799 ක් වූ අතර භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව එම අගය රු.16,371,573 ක් වූයෙන් රු.2,808,828 ක වෙනසක් විය. | 2024 වර්ෂයේදි සියළුම ස්ථානවල ලි බඩු හා යන්ත්‍රෝපකරණ තක්සේරු කර ඒ අනුව සභාව සතු යන්ත්‍රෝපකරණ හා ලි බඩු උපකරණ ගිණුම් ශේෂය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ වෙනස්කම් හඳුනාගෙන ලේඛන නිවැරදි කර, ගිණුම් නිවැරදි කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

| නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 371 (3) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවස්ථා දෙකකදී ලබාගත් රු.78,385 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. | අදහස් දැක්වීම් සිදුකර නොමැත. | යථෝක්ත මුදල් රෙගුලාසි විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,171,327 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,877,344 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනය අනුව මුදල් පොතේ ශේෂය හා එදිනට පිළියෙල කළ බැංකු සැසඳුමේ මුදල් පොතේ ශේෂය අතර රු.232,536ක වෙනසක් විය. | වෙනස නිවැරදි කිරීමට 2023 අගෝස්තු 17 දින පැවති විගණන කමිටුවේදී සාකච්ඡා කරන ලද අතර ඒ අනුව පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට යොමු කර ඇත. | නිවැරදිව ගිණුම්වලට ගැළපීම් කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 වර්ෂය | | | | 2022 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 8,071 | 7,941 | 7,942 | 2,011 | 7,861 | 6,442 | 5,432 | 2,012 |
| කුලී | 10,786 | 1,148 | 949 | 207 | 9,686 | 9,544 | 9,536 | 8 |
| බලපත්‍ර ගාස්තු | 1,020 | 880 | 880 | - | 1,021 | 576 | 576 | - |
| වෙනත් ආදායම් | 89,437 | 37,083 | 37,083 | - | 61,253 | 44,084 | 44,084 | - |
| **එකතුව** | 109,314 | 47,052 | 46,854 | 2,218 | 79,821 | 60,646 | 59,628 | 2,020 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.2,012,165 ක වරිපනම් හා බදු හිඟයෙන් රු.960,800 ක මුදලක්ද, වර්ෂයේ බිල්කිරීම් රු.7,941,255 මුදලින් රු.1,049,684 ක මුදලක්ද අයකර නොතිබුණි. | ඉදිරියේදී හිඟ ආදායම අයකර ගැනිමට කටයුතු කරන බව. | හිඟ ආදායම් හා බිල්කළ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ සිට 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය සභාව විසින් ගොඩනැගිලි අනුකූලතා සහතික 68 ක් නිකුත් කර තිබූ නමුත් ඉන් ගොඩනැගිලි 05 ක් සඳහා පමණක් තක්සේරුවක් ලබාගෙන වරිපනම් අයකර තිබූ අතර ගොඩනැගිලි 63 ක් සඳහා තක්සේරුවක් ලබාගෙන වරිපනම් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ අනුකූලතා සහතිකය ලබාගත් එක් අයෙකුගේ වරිපනම් තක්සේරු මුදල් සංශෝධනය කිරීමට අදාල ගොඩනැගිලි සැලැස්ම තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කර ඇති බව. | වරිපනම් ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් 14 ක් සමාලෝචිත වර්ෂය වන විටත් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීම සඳහා කටයුතු කරමින් සිටින බව. | 1947 අංක 08 දරන රාජ සන්තක ඉඩම් ආඥා පනතේ 2.4.1 වගන්තිය අනුව ක්‍රියාකර පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 වාහන පද්ධති කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1645(ඈ) වගන්තිය ප්‍රකාරව වාහනය භාර රියදුරු විසින් එක් එක් ගමන නිමකළ වහාම දෛනික ධාවන සටහනේ කළ යුතු සියලුම සටහන් කරන ලෙස දක්වා ඇතත්, 2023 ඔක්තෝබර් 30 දින සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී අලව්ව සභාව සතු වාහන 03 ක හා ට්‍රැක්ටර් 02 ක ධාවන සටහන් අනුව මයිලෝ මීටරය හා වාහනයේ මයිලෝ මීටරය අතර පිළිවෙලින් කි.මී. 4,209 ක හා මීටර් පැය 68 ක වෙනසක් පැවතුණි. | මයිලෝ මීටරයේ හා ධාවන සටහන් අතර වෙනසක් සිදු වී ඇති බව පිළිගන්නා බවත් ඒ අනුව නිවැරදි කිරීම් සිදු කරන බව. | යථෝක්ත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වෙනත් ආයතනවල නමට ලියාපදිංචි වී ඇති සභාව පරිහරණය කරනු ලබන වාහන 04 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය වන විටත් කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට අදාළ කටයුතු කරමින් සිටින බව. | පවරා නොගත් වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 වාෂර්ික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව (කර්මාන්ත අංශයේ ආංශික සැලැස්ම) සභාව විසින් ව්‍යාපෘති 66 ක් ඉටුකළ යුතුව තිබුණත්, ඉන් ව්‍යාපෘති 25 ක් පමණක් ඉටුකර තිබුණි. එසේ ඉටු නොකළ ව්‍යාපෘති හා ඒ සඳහා වාර්ෂික අයවැය මගින් රු.21,940,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. | ක්‍රියාකාරි සැලැස්මට අනුව අදාල වැය ශීර්ෂ යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | අයවැය මගින් ප්‍රතිපාදන සලසා ඇති හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත ව්‍යාපෘති ඉටුකළ යුතුය. |

**4.2 පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | ලේකම්ගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතුව කසළ කළමනාකරණ මධ්‍යස්ථානයක් පැවතියද ගලි අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ප්‍රමිතිගත ප්‍රතිචක්‍රීකරණ පද්ධතියක් නොමැති වුවත් සභාව විසින් සභා බල ප්‍රදේශයේ ගලි අපද්‍රව්‍ය ගලි රථය යොදවා ඉවත් කර කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ වලක් හාරා ඒ තුළට දැමීමට කටයුතු කර තිබුණි. | වර්ෂය තුළ ගලි රථ 87 ක් පමණ උරා ගැනීමේ වලට දමා ඇති අතර දිනපතා බැහැර කිරීමක් සිදු නොකරන අතර උරා ගැනීමෙන් පසු බැහැර කිරීම සිදු කරන බව. | පරිසරය ආරක්ෂා වන පරිදි කසළ බැහැර කිරීම සිදු කළ යුතුය. |